# පුරාවිද්‍යා විෂය සඳහා වූ සේනක බණ්ඩාරනායක පුස්තකාල වර්ගීකරණ ක්‍රමය

## Senake Bandaranayake library classification system for archaeology (SBC)

**ජී. එච්. ඉනෝකා දිල්හානි**[1]


## Abstract

Senake Bandaranayake library classification system is based on the Library collection of the Postgraduate Institute of Archaeology (PGIAR), University of Kelaniya. It was introduced by Emeritus Professor Senaka Bandaranaike in 1987. It has formulated its own classification system to suit the needs of a small to medium scale library. Archaeology is a multi-disciplinary subject. Therefore the use of a general classification system was problematic when organizing a specialized collection, such as archaeology. The Dewey Decimal Classification (DDC) and the Universal Decimal Classification (UDC) are the most widely used classification systems in the world. It is observed that neither the DDC nor UDC is suitable to classify an archaeological collection of this nature. There is no other generally accepted scheme for a special collection such as archaeology. Therefore, Prof. Senake Bandaranayake has decided to formulate its own classification scheme to serve the needs. This classification system is designed mainly for the purpose of organizing a collection of archeology and related subjects, giving priority to Sri Lanka. This makes it easier for the reader to access the information they need.For over 30 years, this classification system has been used by the Postgraduate Institute of Archaeology to organize their library collection. However, this classification has not been discussed in the field of Library Science in Sri Lanka. The main objective of this article is to introduce the Senaka Bandaranayake classification system for archaeology and to get suggestions and ideas from the library community.


**Keywords:** Library Classification; Subject classification; Archaeology; Sri Lanka

*[1]පුස්තකාලය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (කැලණිය විශ්වවිද්‍යාලය), කොළඹ 07.*
*email: libpgiar@kln.ac.lk*

## හැඳින්වීම

පුස්තකාල එකතු වර්ගීකරණයදී ඩිවී දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය වැනි වර්ගීකරණ ක්‍රම භාවිතය ඉතා සුලභය. නමුත්, විෂය විශේෂ එකතුවක් පවතින පුස්තකාල සඳහා මෙවැනි පොදු වර්ගීකරණ ක්‍රම යෝග්‍ය නොවන්නේ දීර්ඝ වර්ග අංක සැකසීමට සිදුවීම හා සූක්ෂම වර්ග අංක සැදීමට නොහැකි වීම ආදී ගැටලු හේතුකොට ගෙනය. මෙමගින් කාර්යමණ්ඩලයේ කාලය අපතේ යාම සහ පාඨකයා වෙහෙසට පත් වීම නොවැලැක්විය හැකිය. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාල එකතුව සංවිධානය කිරීමේදී මෙම ගැටලුවට පැන නැඟින. මේ සඳහා පොදු වර්ගීකරණ ක්‍රමයක් භාවිත කිරීම මගින් එකතුව නිසි පරිදි සංවිධානය කිරීම අපහසු විය. එයට පිළියමක් ලෙස 1987දී මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතා විසින් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාල වර්ගීකරණ ක්‍රමය (PGIAR library classification system)නමින් වර්ගීකරණ ක්‍රමයක් ඉදිරිපත් කරන ලදි. මෙම වර්ගීකරණ ක්‍රමය මගින් පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ සූක්ෂම විෂය පථයක් සඳහා වුවද නියමිත ස්ථානයක් ලබා දීම පහසු විය.

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාල වර්ගීකරණ ක්‍රමය, කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන (PGIAR)පුස්තකාල එකතුව පදනම් කරගනිමින් එහි අවශ්‍යතාවන්ට ගැලපෙන ලෙස සකස් වූවකි. මෙහිදී, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය මේ සඳහා පදනම් කරගෙන ඇත. ඩිවී දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය වැනි පොදු වර්ගීකරණ ක්‍රම ලෝකයේ බහුලව භාවිත වුවද මෙවැනි විෂය විශේෂී එකතුවක් වර්ගීකරණය කිරීම සඳහා සුදුසු සරල, පිළිගත් වර්ගීකරණ ක්‍රමයක් නොතිබිණි. එබැවින් ඒ සඳහා සුදුසු වර්ගීකරණ ක්‍රමයක් සකස් කිරීමට අවශ්‍ය විය, එය පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාල වර්ගීකරණ ක්‍රමයේ (PGIAR library classification system) ආරම්භය විය. එහි පුරෝගාමියා වූයේ පුරාවිද්‍යා හා මානවවිද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු වූ මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතාය. යුරෝපයේ උසස් අධ්‍යාපනයත් සමඟ ලැබූ අත්දැකීම් හා පුරාවිද්‍යාව, මානව විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍ය පිළිබඳව ඔහුතුළ වූ හසළ දැනුම මේ සඳහා මහෝපකාරීව ඇත. විශේෂයෙන්ම එංගලන්තයේ බ්‍රිතාන්‍ය පුස්තකාලය, බ්‍රිතාන්‍ය කෞතුකාගාරය හා නෙදර්ලන්තයේ ලයිඩන් විශ්වවිද්‍යාලයේ පුස්තකාලය පරිහරණය සඳහන් කළ හැක. විශ්ව දශම වර්ගීකරණයේ මෙන්ම මෙම වර්ගීකරණයේ සුවිශේෂත්වය වන්නේ එහි නිර්මාතෘ පුස්තකාලවේදියෙකු නොවීමයි. මෙම වර්ගීකරණය සකස් කිරීමේදී ඩිවී දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය, කොංග්‍රස් පුස්තකාල වර්ගීකරණය හා බ්ලිස් ග්‍රන්ථවිද්‍යාත්මක වර්ගීකරණය වැනි වර්ගීකරණවල ආභාෂය ලබා ඇත.

එහි මුල් සංස්කරනයේදී මානෙල් බණ්ඩාරනායක මහත්මියගේ පුස්තකාල වෘත්තීයමය අත්දැකීම් හා පළපුරුද්ද මහත් පිටුවහලක් වී ඇත. එවක පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලයේ පුස්තකාල උපදේශක ලෙස කටයුතු කළ පී.ඒ. පියසේන මහතාගේ දායකත්වයද මේ සඳහා ලැබී ඇත. මෙම වර්ගීකරණයේ පළමු සංස්කරණය

1987දී හඳුන්වා දෙන ලදි. මෙහි දෙවන සංස්කරණයහා තුන්වන සංස්කරණය 1995දී ද, 4 වන සංස්කරණය 1997දීද බිහි විය. මෙම සංස්කරණයන් ඉදිරිපත් කිරීමට මහාචාර්ය සේනක බණ්ඩාරනායකයන්ට පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රවීණයින්ගේ දායකත්වය ලැබී ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනියක වූ එච්.වී. කුලතුංග මහත්මිය, එවකට පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලයේ වැඩබලන සහකාර පුස්තකාලයාධිපති ලෙස කටයුතු කළ ආචාර්ය ප්‍රමිලා ගමගේ මිය හා කැලණිය විශ්වවිද්‍යාලයේ හිටපු පුස්තකාලයාධිපති එල්. ඒ. ජයතිස්ස මහතාගේ දායකත්වය විශේෂයෙන් සඳහන් කළ යුතුය. වර්තමානයේ භාවිත 5වන සංස්කරණය ජ්‍යෙෂ්ඨ පුස්තකාල උපදේශකවරියක වූ මානිල් සිල්වා මිය විසින් 2002 වසරේදී සංශෝධනයට ලක් කරන ලදි. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාල වර්ගීකරණය ලෙස එතෙක් භාවිතයේ පැවති මෙම වර්ගීකරණ ක්‍රමය 2007 දී, සේනක බණ්ඩාරනායක පුස්තකාල වර්ගීකරණ ක්‍රමය, SBC ලෙස එවක සහකාර පුස්තකාලයාධිපති ලෙස කටයුතු කළ නදීකා රත්නබාහු මිය විසින් හඳුන්වා දෙන ලදි (රත්නබාහු, 2007). වසර 30කට අධික කාලයක් තුළ භාවිතයේ පවතින මෙම වර්ගීකරණයේ 5 වන සංස්කරණය ප්‍රකාශයට පත් කිරීම සඳහා සංස්කරණය වෙමින් පවතී. මේ සඳහා ආයතනයේ පුරාවිද්‍යාව පිළිබඳ විෂය විශේෂඥයින්ගේ හා ප්‍රවීණ පුස්තකාලවේදීන්ගේ උපදේශක සහාය ලබා ගෙන ඇත.

විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි රටකට පුරාවිද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රයක් සඳහා වූ විශේෂ වර්ගීකරණ ක්‍රමයක අවශ්‍යතාවය ඉහළය. පුරාවිද්‍යාව සඳහා යෝග්‍ය වර්ගීකරණ ක්‍රමයක් මහාචාර්ය සේනක බණ්ඩාරනායක විසින් සකසා තිබුණද එය පුස්තකාල භාවිතය සඳහා ප්‍රචාරණය වී නොමැත. එබැවින් මෙවැනි විශේෂ වර්ගීකරණ ක්‍රමයක් හඳුන්වාදීමේ අවශ්‍යතාවය වර්තමානය වන විට පැන නැඟී ඇත.

Idrees (2012)ට අනුව ඩිවි දශම වර්ගීකරණය, කොංග්‍රස් පුස්තකාල වර්ගීකරණය හා විශ්ව දශම වර්ගීකරණය පුස්තකාලවල එකතු සංවිධානය සඳහා ජාත්‍යන්තර හා බහුල වශයෙන් භාවිත වර්ගීකරණ ක්‍රම වේ. මෙම සියලු වර්ගීකරණ ක්‍රම භාවිත කිරීමේදී පහසුවන අතර පොදු එකතුන් සංවිධානය කිරීම සඳහා සුදුසු වේ. ඉස්ලාම් ධර්මයට අදාළ විෂය විශේෂ එකතුවක් සංවිධානය කිරීමේදී මෙවැනි පොදු වර්ගීකරණ ක්‍රම භාවිතය ඉතා ගැටලු සහගත බව පෙන්වා දී ඇත. ඇතැම් පුස්තකාල මේ සඳහා දැනට පොදු භාවිත වර්ගීකරණ ක්‍රමවේදයන් විස්තාරණය කර සකස් කරගත් ක්‍රමවේදයන් භාවිතා කරනු ලබන බව පෙන්වා දෙයි. මෙමඟින් ඉස්ලාම් ධර්මය පිළිබඳ එකතුවක් සංවිධානය කිරීමට දියුණු කළ හැකි ඉතාමත් යෝග්‍ය වර්ගීකරණ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර ඇත.

ආයුර්වේද විෂය හා සම්බන්ධ එකතුවක් සහිත පුස්තකාලවල එකතුව සංවර්ධනය කිරීම සඳහා යොදා ගන්නා වර්ගීකරණ ක්‍රම පිළිබඳව පර්යේෂණයක ප්‍රතිඵල අනුව, පොදු වර්ගීකරණ ක්‍රම යොදා ගනිමින් කිසියම් විෂය විශේෂ එකතුවක් සංවිධානය

කිරීමේදී විවිධ ගැටලු පැන නගින බව පෙන්වා දී ඇත. ඒවාට විසඳුම් ලෙස බෙහෝ විෂය විශේෂ එකතුන් සහිත පුස්තකාල ඔවුන් විසින් සකස් කර ගන්නා ලද විද්‍යානුකූල නොවූ සම්මතයෙන් තොර ක්‍රමවේදයන් භාවිත කරනු ලබන බව Jamdade, et al., (2011) පෙන්වා දෙයි.

බොහෝ පුස්තකාලවල භාවිත වී ඇත්තේ ඩිවී දශම වර්ගීකරණය හා කොංග්‍රස් පුස්තකාල වර්ගීකරණය වැනි ක්‍රමවේදයන්ය. මේ නිසා බොහෝ පුස්තකාලයාධිපතිවරු වෙනත් වර්ගීකරණ ක්‍රම තෝරාගැනීමට මැලි කමක් දක්වන බව Batley (2005) සඳහන් කරයි. නමුත් විෂය විශේෂිත එකතුවක් වර්ගීකරණය කිරීමේදී මෙවැනි පොදු වර්ගීකරණ ක්‍රම භාවිතා කිරීම ගැටලු සහගත වේ. කිසියම් විෂයක් ගැඹුරින් විශ්ලේෂණය කර වර්ග අංක සැකසීමට සිදු වේ. මෙහිදී දීර්ඝ වර්ග අංක ලබා දීමට සිදු වේ. මෙමගින් වර්ගීකාරකයා මෙන්ම උපයෝජකයාද අපහසුතාවයට පත් වන බව ඔහු පෙන්වා දෙයි.

ග්‍රීසියේ American School of Classical Studies ආයතන පුස්තකාලයේ ඇති පුරාවිද්‍යාව, වාග්විද්‍යාව, ඉතිහාසය හා කලා ඉතිහාසය වැනි විෂයන්ගෙන් යුත් එකතුවක් සංවිධානය කිරීම සඳහා 1903 දී Theodore Woolsey Heermance නම් පුස්තකාලවේදියා විසින් සකස් කරන ලද ඔවුනට ආවේණික වූ වර්ගීකරණ ක්‍රමයක් භාවිත කරන ලද බව සඳහන් වෙයි. එනම්, විෂය විශේෂිත එකතුවක් වර්ගීකරණය කිරීමේදී හා සංවිධානය කිරීමේදී පොදු වර්ගීකරණ ක්‍රම භාවිත කිරීම ගැටලු සහගත බව ශත වර්ෂයකට පෙරද හඳුනාගෙන තිබිණ (Mackay, 2003).

Scheerer and Hines (1974) ට අනුව ඇමරිකාවේ වෛද්‍ය විද්‍යා පුස්තකාල 941ක් අතරින් 589ක් National Library of Medicine Classification භාවිත කරනු ලබන බව දක්වයි. 1946 -1956 කාලය තුළ වෛද්‍ය විද්‍යා පුස්තකාල එකතුන් සංවිධානය කිරීම සඳහා විෂය විශේෂ වර්ගීකරණ ක්‍රම බොහෝ ප්‍රමාණයක් භාවිත කර ඇත. මේ අතර Boston Medical Library, Army Medical Library වර්ගීකරණ ක්‍රමවලට අමතරව එම පුස්තකාල විසින්ම සකස් කරගන්නා ලද වර්ගීකරණ ක්‍රම බොහොමයක් භාවිත කර ඇති බව Bloomquist (1959) විසින් දක්වා ඇත.

**සේනක බණ්ඩාරනායක පුස්තකාල වර්ගීකරණ ක්‍රමය**

මෙම වර්ගීකරණය පුරාවිද්‍යාව හා ආශ්‍රිත පුස්තකාල එකතුන් වර්ගීකරණය සඳහා සකස් කර ඇති අතර ශ්‍රී ලංකාව සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. මෙහිදී මිශ්‍ර අංකනය යොදා ගෙන ඇත. එනම්, ඉංග්‍රීසි අක්ෂර මාලාව හා හින්දු අරාබි ඉලක්කම් භාවිත කෙරේ. පුරාවිද්‍යාව පිළිබඳ විෂය තොරතුරු අවශ්‍යතාවය මතු වන්නේ ප්‍රධාන වශයෙන් එහි භූගෝලීය කලාපය මූලික කරගනිමිනි. අනෙකුත් වර්ගීකරණ ක්‍රම එනම්,

ඩිවී දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය හා දෙතිත් වර්ගීකරණය විෂය මූලික කර ගනිමින් සකස් කර ඇති නමුත් මෙහිදී භූගෝලීය කලාපය ප්‍රධාන කර ඇත. වර්ග අංක ගොඩනගා ගැනීමේ අවස්ථාව පුළුල් කිරීම සඳහා දශම තිත හා ඉංග්‍රීසි කුඩා අකුරු (simple letters) දෙකකින් යුත් කේත ක්‍රමයක් භාවිත කෙරේ. එසේම අලුතින් බිහිවන විෂයන් සඳහා වර්ග පංති හිස්ව තබා ඇත. පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය විශ්ව ඥානයේ සියලු විෂයන් සමඟ සම්බන්ධතාවයක් දක්වන බැවින් එවැනි විෂය ක්ෂේත්‍රයන් සංවිධානය සඳහා නිද. BZ –Archaeology specialized disciplines යටතේ අවකාශය සලසා ඇත.

**ප්‍රධාන වර්ග පංති**

වර්ගීකරණ පද්ධතිය ගුණාත්මක බව හා ජීවමාන බව ආරක්ෂා වන්නේ එම වර්ගීකරණ පද්ධතියේ තිබෙන ප්‍රධාන ලක්ෂණ නැතහොත් මූලිකාංග මතය (ජයතිස්ස, 2011). මෙම වර්ගීකරණය එවැනි මූලිකංග බොහෝමයකින් යුක්තය. මෙහි වර්ගීකරණ පද්ධතිය හැඳින්වීම, ප්‍රධාන වර්ග පංති, උපලේඛනය, අංකනය, අනුක්‍රමණිකාව හා වර්ගීකරණය සඳහා උපදෙස් යන අංගවලින් යුක්තය.

වර්ගීකරණය ප්‍රධාන වශයෙන් මූලික කොටස් තුනකින් දැක් වේ.

**A- පොදු විෂය** - කිසියම් භූගෝලීය කලාපයකට හෝ රටකට අයත් නොවන, පුරාවිද්‍යාව හා ආශ්‍රිත විෂයන්හැර අනෙක් සියලු විෂයයන් මේ යටතේ කාණ්ඩ ගත කෙරේ.

**B- පුරාවිද්‍යාව** - කිසියම් කලාපයකට හෝ රටකට නොවැටෙන පුරාවිද්‍යාව පිළිබඳ අන්තර්ගත සියලුම කෘතීන්, එනම්, පුරාවිද්‍යාවේ ශිල්පීය ක්‍රම, පරිසර පුරාවිද්‍යාව, ඓතිහාසික පුරාවිද්‍යාව, ණානක විද්‍යාව, අභිලේඛන, මානව පුරාවිද්‍යාව, උරුම කලමනාකරණය, හා කෞතුකාගාර විද්‍යාව මේ යටතට අයත් වේ. එමෙන්ම, කලාව, වාස්තුවිද්‍යාව, මූර්ති ශිල්පය, සංස්කෘතිය අධ්‍යයනය, වැනි විෂයන්ට අමතරව කාර්මික පුරාවිද්‍යාව හා සාගර පුරාවිද්‍යාව ආදියද මෙයට අයත් වේ. මෙම විෂය පුළුල් පරාසයක විහිදී ඇත.

**C - ප්‍රාදේශීය කලාපයන් හා රටවල්** - කිසියම් කලාපයකට හෝ රටකට හෝ අයත් යැයි සැලකිය හැකි පොදු හා පුරාවිද්‍යාත්මක කෘතීන් මේ යටතේ කාණ්ඩගත කෙරේ. එනම්, A පොදු විෂය සහ B පුරාවිද්‍යාවයන කාණ්ඩ දෙකෙහි විෂයන් සමඟ C කලාපය හෝ රට ඒකාබද්ධ කිරීමට ඉඩ සලසයි. මෙහිදී පාදක කොට ගත් මූලධර්මය වන්නේ පුරාවිද්‍යාඥයන් පොදුවේ භූගෝලීය කලාපය පදනම් කර තොරතුරු සෙවීමට පෙළඹීමයි. මෙම වර්ගීකරණය භාවිත කිරීමේදී වර්ගීකරණයට අදාළ පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයන් (archaeology related disciplines) පිළිබඳ පැහැදිළි අවබෝධයක් ලබා ගැනීම අවශ්‍ය වේ.

A හා B යන ප්‍රධාන වර්ග පන්ති දෙකම උප පන්ති වලට ද බෙදේ. උපප්‍රධාන වර්ග පන්තිය ඉංග්‍රීසි අකුරු තුනෙන් සමන්විත වන අතර, දශම තිත භාවිතා කොට තවදුරටත් පුළුල් කර ඇත.

**ප්‍රධාන වර්ග පංති සාරාංශය**

**සාමාන්‍ය කෘති (A)**

| | |
|---|---|
| AA | සාමාන්‍ය කෘති |
| AB | ආගම් |
| AC | දර්ශනය |
| AD | ඉතිහාසය හා ශිෂ්ටාචාරය |
| AE | කලාව |
| AF | භාෂාව හා සාහිත්‍ය |
| AG | ගණිතය හා සංඛ්‍යානය |
| AH | සමාජීය විද්‍යා |
| AI | භූගෝල විද්‍යාව |
| AJ | ස්වභාවික විද්‍යාව |
| AK | ව්‍යවහාරික විද්‍යාව |

**පුරාවිද්‍යාව (B)**

| | |
|---|---|
| BA | සාමාන්‍ය කෘති |
| BB | ඉතිහාසය හා න්‍යාය |
| BC | ශිල්පීය ක්‍රම |
| BD | සංරක්ෂණය |
| BE | පරිසර විද්‍යාව |
| BF | ප්‍රාග් ඉතිහාසය |
| BG | මූල ඉතිහාසය |
| BH | ඓතිහාසික පුරාවිද්‍යාව |
| BI | කලා, ගෘහනිර්මාණ ශිල්පී |
| BJ | ඉතිහාසය හා පුරාවිද්‍යාව |
| BK | සංස්කෘතිය |
| BZ | විශේෂිත විෂයන් |

**ප්‍රාදේශීය කලාප (C)**

| | |
|---|---|
| 1000 | අප්‍රිකාව |
| 2000 | ඇමරිකාව |
| 3000 | ආසියාව |
| 4000 | ධ්‍රැවීය කලාපය |
| 5000 | යුරෝපය |
| 6000 | ඕෂනියාව |
| 7000 | වෙනත් |

**උපලේඛනය (Schedule)**

වර්ගීකරණ පද්ධතියේ අඩංගු වන සමස්ත විෂය ලැයිස්තුව උපලේඛනයයි. සියලුම ප්‍රධාන විෂයන්, ඊට අදාළ උපවිෂයයන් හා සූක්‍ෂම විෂයයන් මෙම ලේඛනයේ සඳහන් වේ. උපලේඛනය තුළ ප්‍රධාන වර්ග පංති අනුක්‍රමයකට අනුව සංවිධානය කර ඇත. අලුතින් බිහිවන විෂයන් සඳහා අදාළ ස්ථාන හිස්ව (හිදැස් වියුක්තිය) තබා ඇත.

නිදසුන් ලෙසඃ

**AB RELIGION**

**SUMMARY OF CLASSES**

| | |
|---|---|
| ABA | Religion – general |
| ABB | Comparative religion |
| ABC | Primitive religions |
| ABD | Archaic religion |
| ABE | Living religion |

| | |
|---|---|
| ABE.Bu | Buddhism -General |
| ABE.Bu.Ca | Canonical texts/ commentaries |
| ABE.Bu.Hi | History Buddhism and life of Buddha |
| ABE.Bu.Mo | Monasticism and clergy |
| ABE.Bu.Ph | Philosophy, Doctrine |
| ABE.Bu.Ri | Rituals |
| ABE.Bu.So | Sociology of Buddhism |
| ABE.Bu.In | Institutions, Temples |

++ Same system of division as in ABE.Bu should be applied to other living religions if there is sufficient material in the collection to merit subdivision.

| | |
|---|---|
| ABE.Ch | Christianity |
| ABE.Cn | Confucism |
| ABE.Hi | Hinduism |
| ABE.Ja | Jainism |
| ABE.Ju | Judaism |
| ABE.Ta | Taoism |

| | |
|---|---|
| ABF | Religious institutions - non specific |
| ABG | Religious ritual, symbolism - non specific |
| ABH | Sociology of religion – non specific |
| ABI | Mythology- General |

**පුරාවිද්‍යාවේ ඉතිහාසය හා න්‍යාය**

**BB ARCHAEOLOGICAL THEORY AND HISTORY**

BBA General works
BBB Archaeological theory and methods
BBC Archaeological history
BBD Cognitive archaeology

**BC TECHNIQUES**

BCA Archaeological techniques – general
BCB Data generative techniques
BCB.Do Documentation techniques- Archaeological photography, aerial photography, photogrammetry, drawing and illustration, photo documentation.
BCB.Ex Excavation
BCB.Pr Prospecting techniques
BCB.Su Survey, Field survey etc.

BCC Classificatory techniques
BCD Analytical techniques
BCD.Da Data processing, mathematics and archaeology etc.
BCD.La Laboratory analytical techniques, Physical & Chemical etc.

BCE Chronometric techniques (i.e. all science based dating techniques, geological, botanical, physical and chemical etc.)
BCF Publication, report writing etc

වක්‍ර (Table)
ශ්‍රී ලංකාවේ ඉතිහාසය යුග බෙදීම් සඳහා විශේෂ වක්‍රයක් භාවිත කර ඇත. මෙමගින් ඉතිහාස කාල වකවානුව අනුව එකතුව වඩාත් සාර්ථකව සංවිධානය කළ හැක.

**SPECIAL TABLE FOR INDIVIDUAL COUNTRIES**

**SRI LANKA**

3608 AD History and civilization
3608 ADA General
++++ For prehistoric period see BF
3608 ADB Early historic period (Early and Middle and Sigiriya periods)
3608 ADC Middle historic period (Late Anuradhapura and Polonnaruva period)
3608 ADD Later historic period (1) Period of shifting capitals
3608 ADE Later historic period (2) Kotte period

**අංකනය**

අංකනයේදී හින්දු අරාබි අංක මාලාව, ඉංග්‍රීසි අක්ෂර මාලාවේ ලොකු අකුරු (Capital letters) ප්‍රධාන වර්ගපංති සඳහා භාවිත කෙරෙන අතර අක්ෂර දෙකකින් යුත් කේත ක්‍රමය සඳහා කුඩා අක්ෂර (simple letters) භාවිත කෙරේ.

A හා B වර්ග පංති සඳහා ඉංග්‍රීසි අකුරු පමණක් භාවිත කෙරේ. ඉංග්‍රීසි අක්ෂර මාලාවේ පිළිවෙළ අනුගමනය කරමින් උපකොටස්වලට බෙදේ. A හා B යන ප්‍රධාන විෂය කාණ්ඩ දෙක පුළුල් විෂය ක්ෂේත්‍රයන්ට බෙදීම දෙවන අංකය මගින් සිදු වේ. එය තවදුරටත් ව්‍යාප්ත කිරීම තුන්වන අකුරින් පෙන්වයි. නිදසුන් ලෙස

B - Archaeology
BC - Techniques
BCB - Data generative techniques
BCD - Analytical techniquesආදී වශයෙනි.

තවදුරටත් උපබෙදුම් අවශ්‍ය වූ විට ප්‍රධාන වර්ග අංකයට පසු දශම තිත භාවිත කර අංකනයේ ප්‍රසාරණය සිදු කරයි. දශම තිතට පසුව අකුරු දෙකේ කේත ක්‍රමයක් භාවිත කිරීමෙන් එම විෂය තවදුරටත් විශ්ලේෂණය කරයි.

*BCB - Data generative techniques*
*BCB.Do - Documentation techniques*
*BCB.Ex - Excavation*
*BCB.Pr - Prospecting techniques*

C වර්ග පංතිය, භූගෝලීය කලාපය හෝ රටවල් සඳහා සංඛ්‍යා හතරකින් යුත් අංකයක් ලබා දී ඇත. තවදුරටත් විශේෂීකරණයක් අවශ්‍ය වූ විට අංක බෙදීමක් මගින් විස්තාරණය කර ඇත.

නිදසුන් ලෙස

1000 අප්‍රිකාව
2000 ඇමරිකාව
3000 ආසියාව
3600 දකුණු ආසියාව
3603 ඉන්දියාව
3608 ශ්‍රී ලංකාව

විෂය හා භූගෝලීය කලාපය බද්ධ වූ අවස්ථාවකදී, පළමුව භූගෝලීය කලාපය හෝ රට සමග එහි විෂය සංකේත අංකය ඒකාබද්ධ කෙරේ.

නිදසුන් ලෙස

| | |
|---|---|
| ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පය | 3608 BIC |
| අප්‍රිකාවේ ඉතිහාසය | 1000 ADA |

එක් විෂයකට වඩා වැඩි අවස්ථාවලදී ප්‍රධාන විෂය යටතේ වර්ග කිරීම සිදු වේ. එනම් පුළුල්ව සාකච්ඡා වන විෂය යටතේ වර්ග කෙරේ. එකිනෙකට සම්බන්ධතාවක් නොදක්වන විෂයන් යටතේ ඇති විට පළමුව සාකච්ඡා වන විෂය යටතේ වර්ග කරයි. අක්ෂර කේත භාවිත කිරීමේදී (two letter code) විෂය ශීර්ෂයේ (Subject heading) හෝ මුර පදයෙහි (keyword) මුල් අක්ෂර දෙක භාවිත කරයි. නිදසුන් ලෙස

| | |
|---|---|
| BC | - Techniques |
| BCB | - Data generative techniques |
| BCB.Do | - Documentation techniques |
| BCB.Ex | - Excavation |

මෙම වර්ගීකරණය, එකතුවේ සංවර්ධනය හා විෂයෙහි වර්ධනයත් සමඟ තවදුරටත් විස්තාරණය කළ හැකි ආකාරයට සකස් කර ඇත. ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇත. පොත් රාක්කගත කිරීමද මෙම අනුපිළිවෙළටම සිදු වේ. මෙබඳු වර්ගීකරණ ක්‍රමයක් පුස්තකාලය සඳහා භාවිත කිරීමට හේතු වී ඇත්තේ පුරාවිද්‍යාව කලාපීය, රටවල් හෝ ප්‍රදේශ අනුව අධ්‍යයනය කරනු ලබන විෂයක් වීමය. මේ නිසා විෂයට අදාළ ප්‍රකාශන කරා පහසුවෙන් ප්‍රවේශ වීමට හැකියාව ඇත.

**විශේෂ ලක්ෂණ**

පුළුල් විෂයක් කෙටි කර දැක්වීම, සරල වීම, නම්‍යතාවය, පහසුවෙන් මතක තබා ගැනීමේ හැකියාව හා අංකනයේ ප්‍රසාරණීයතාව වැනි අංකනයක තිබිය යුතු සියලුගුණාංග මෙහි අන්තර්ගතය. මෙහි තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ වර්ග අංක සකස් කිරීමට අවශ්‍යය නොවීමයි. සියලුම විෂයන් නිරාවරණය වන පරිදි වර්ග අංක දක්වා ඇත. වර්ගීකරණයේ නිර්මාතෘවරයා එම විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ මනා දැනුමකින් යුක්ත වීම මෙයට හේතු වී ඇත.

අංකය සරල වීම හා ස්මෘති සහායක සහිත වීම සඳහා නිදසුනක් ලෙස

Prehistoric Indian rock paintings

DDC(21)-759.01130954 SBC –3603 BFC

Inscription of Ceylon

DDC (21) – 417.5493 SBC –3608 BJB

විෂය සන්දර්භය අනුව එයට සුදුසු අංකය තෝරාගැනීම කළ හැක. මෙහිදී වර්ගකාරකට පුරාවිද්‍යාව හා ඒ ආශ්‍රිත විෂයන් පිළිබඳව දැනුම, වර්ගීකරණය භාවිතය පහසු කරවයි. විශේෂ පුස්තකාලයක පුස්තකාලයාධිපතිවරයෙකු හැමවිටම පුස්කාලවිද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳව මෙන්ම අදාළ විෂය පිළිබඳවද දැනුමින් යුතු බව මහාචාර්ය සේනක බණ්ඩාරනායකයන්ගේ අදහස විය. ඒ බව මෙම වර්ගීකරණ ක්‍රමය මගින්ද පැහැදිලි වේ.

මෙම වර්ගීකරණ ක්‍රමය ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවට ප්‍රමුඛස්ථානය ලබා දෙමින් පුරාවිද්‍යාව හා ආශ්‍රිත විෂය එකතුවක් සංවිධානය කිරීම සඳහා නිර්මාණය කර ඇත. ශ්‍රී

ලංකාවේ ඉතිහාස චක්‍රය පරීක්ෂා කිරීමේදී මෙය පැහැදිලි වේ. ඉතිහාස යුග බෙදීම් අප රටට ගැලපෙන ආකාරයට සකස් කර ඇත. වෙනත් භූගෝලීය කලාපයකට වුවද එම අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි වෙනස්කම් සිදු කර භාවිත කළ හැක.

**සමාලෝචනය**

බොහෝ විෂය විශේෂී පුස්තකාල ඔවුන්ගේ එකතුව සංවිධානය කිරීම සඳහා එම විෂයට ආවේණික වූ විශේෂ වර්ගීකරණ ක්‍රම භාවිත කරයි. එවැනි වර්ගීකරණ ක්‍රම රාශියක් දැනට භාවිතයේ පවතී. US Geological Survey Library Classification System, National Library of Medicine Classificationඑවැනිනිදසුන් කීපයකි. පුරාවිද්‍යා විෂය එකතුවක් සාර්ථක ලෙස සංවිධානය කළ හැකි වර්ගීකරණයක් ලෙස සේනක බණ්ඩාරනායක වර්ගීකරණ ක්‍රමය හැඳින්විය හැක.

සියුම් විෂය ක්ෂේත්‍රයක් සඳහා වුවද නිශ්චිත වර්ග අංකයක් ලබා දීම තුළින් එකතුව සාර්ථකව සංවිධානය කිරීමේ හැකියාව ඇත. එමගින් විෂය විසිරී යාම වලක්වා ගත හැකි අතර යම් විෂයක් ගැඹුරින් විශ්ලේෂණය කිරීමේ හැකියාවද ලැබේ. මෙනිසා පාඨකයාට තමන්ට අවශ්‍ය තොරතුර වෙත පහසුවෙන් ප්‍රවේශ වීමට හැකියාව ලැබී ඇත. වර්තමානයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තු පුස්තකාලය, මධ්‍යම සංස්කෘතික අරමුදල පුස්තකාලය හා එහි ශාඛා පුස්තකාල ඉතා සාර්ථක ලෙස ඔවුන්ගේ එකතුව සංවිධානය කිරීම සඳහා මෙම වර්ගීකරණ ක්‍රමය භාවිත කරයි. මෙම වර්ගීකරණය වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයට සකස් කර ඇති අතර මේ වන විට 5 වන සංස්කරණයක් දක්වා වර්ධනයව ඇත.
(2020 මාර්තු 02 දිනට යෙදෙන සම්මානිත මහාචාර්ය සේනක බණ්ඩාරනායකයන්ගේ 5වන ගුණානුස්මරණය වෙනුවෙනි.)

**ග්‍රන්ථ නාමාවලිය**

Batley, S. (2005). *Classification in theory and practice*, Oxford: Chandos Publication.

Bllomquist, Harold (1959).Cataloguing and classification of the Medical library materials: 1946-1956, ten years of progress and problems. *Bulletin of Medical Library Association*, 47 (2). 144-164

Idrees, Haroon (2012).Library classification systems and organization of Islamic knowledge current global scenario and optimal solution.*Library Resources and Technical Services*, 56 (3). 171-182

Jamdade, M.L., Pramila M.L. and Panage, B. M. (2011). Classification schemes in Ayurved College libraries Maharashtra: a study. *Indian Streams Research Journal*, (1) V.

MacKay, Camilla (2003). Classification of a classical studies library in Greece and the changing nature of classical scholarship in the twentieth century. *Cataloguing and Classification Quarterly*, 23 (2). 31-43

NLM Classification (2017).Retrieved from https://www.nlm.nih.gov/ class/terms_ cond.html

Physics and astronomy classification scheme (PACS) 2008. Retrieved from http://www. global-sci.org/jams/authors/pacs2008.pdf

Rathnabahu, R.M. (2010) SBC classification for PGIAR Library. SOSAA 3rd International Congress. Kelaniya: University of Kelaniya.

Scheerer, G. and Hiness, L. E. (1974). Classification systems used in medical libraries.*Bulletinof Medical Library Association*, 62 (3). 273-280

Senake Bandaranayake Classification Manual (1997). Colombo: PGIAR

අලහකෝන්, උදිත (2002). ඩිවී දශම වර්ගීකරණය. ගම්පහ ඃ කර්තෘ

ගමගේ, ප්‍රමිලා (1996). පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය. *පුස්තකාල ප්‍රවෘත්ති* ජූලි- සැප්. පි. 20-23

ජයතිස්ස, එල්. ඒ. (2011). පුස්තකාල වර්ගීකරණ ප්‍රවේශය. කොළඹ ඃ එස්. ගොඩගේ

බස්නායක, එච්. ටී. සහ හෙට්ටිගේ, උදා (1992). පුරාවිද්‍යා ප්‍රවේශය. කොළඹඃ එස්. ගොඩගේ

ලංකගේ, ජයසිරි (1989). වර්ගීකරණ ප්‍රවේශය හා ඩිවී දශම වර්ගීකරණය භාවිතය. කොළඹ ඃ එස්. ගොඩගේ

සතීජා, එම්. පී. (2011). ඩිවී දශම වර්ගීකරණය වර්ගීකරණයේ න්‍යාය හා භාවිතය (පියදාස රණසිංහ පරි.). කඩවතඃ කලර් ක්‍රියේෂන්